# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,275 - 2022 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2022.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 118 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 122 |


*සැ. යු.* - (i) ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 මාර්තු මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අප්‍රේල් මස 29 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එන්. ඒ. ඒ. එස්. නිශ්ශංකආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1988.04.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/10044 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කන්දෙවත්ත පදිංචි ගල්ඔලු කංකානම්ලාගේ සිරිවර්ධන වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L.D.O. 36/5 යටතේ 1993.05.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූල හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟබොඩ පත්තුවේ/393/ඒ, යකඔේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පැල්පිට නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. ගම්. 649 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 39 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.081 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කට්ටි අක 40 සහ ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක 38, |
| *දකුණට* | : | කට්ටි අංක 46 සහ 47, |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 40 සහ 45. |

එන්. ඒ. ඒ. එස්. නිශ්ශංකආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ.

2021 දෙසැම්බර් මස 31 වැනි දින.

04-148/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1998.08.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/මීරි/1841 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බෝතලේ ඉහලගම පදිංචි හෙට්ටි ආරච්චිලාගේ මාග්‍රට් ජයසේකර වෙත ප්‍රදානය කොට මීගමුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මීග/මීරි/11/43 යටතේ 1998.12.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූල හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුවේ 14 ජී ආඳාගලකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බෝතලේ ඉහලගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එෆ්. එස්. පී. පී. 64 දරන කට්ටි කැඩීමේ පිඹුරේ -අංක 26 බ්ලොක් Q දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්. 36ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පොඩි අප්පුහාමි මහතාට අයත් රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | එම්. ඩී. අරනොලිස් මහතාට අයත් ඉඩම, |
| *දකුණට* | : | එච්. පී. රෝමානිස් මහතාට අයත් රජයේ ඉඩම, |
| *බස්නාහිරට* | : | සෝමචන්ද්‍ර මහතාට අයත් ඉඩම. |

ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2021 අප්‍රේල් මස 21 වැනි දින.

04-148/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1994.04.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/මීරි/588 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තවලම්පිටිය පදිංචි ඇලපාත කඩම්බු අප්පුහාමිල්ලාගේ රත්නවතී මැණිකේ වෙත ප්‍රදානය කොට මීගමුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මීග/මීරි/8/37 යටතේ 1994.09.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුවේ 15 විල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තවලම්පිටිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 53/22/1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක මු. පි. ගම්. 646 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 06 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්. 0.074ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 07 (ප්‍රවේශ මාර්ගය),
*නැගෙනහිරට* : කැබලි අංක 07 (ප්‍රවේශ මාර්ගය),
*දකුණට* : කැබලි අංක 05,
*බස්නාහිරට* : කැබලි අංක 04.

ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2021 අප්‍රේල් මස 29 වැනි දින.

04-148/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1998.01.20 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/මීරි/1769 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සකලච්චාරි නැකතිගේ බේබිනෝනා වෙත ප්‍රදානය කොට පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුවේ/කෝරළේ 18ඒ හන්දුරුමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හන්දුරුමුල්ල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, පී. පී. ඒ. 137 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/අංක 15 දරන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් රූඩ් 03, පර්. 15ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කුඹුර,
*නැගෙනහිරට* : මස්නෙස්හාමිගේ ඉඩම,
*දකුණට* : ප්‍රේමදාසගේ ඉඩම,
*බස්නාහිරට* : පෙමාතිස්ගේ ඉඩම.

ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2021 සැප්තැම්බර් මස 14 වැනි දින.

04-148/4

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිග රු ජනාධිපතිතුමා විසින් 1985.02.08 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/7877 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කිඳිවල පදිංචි හේවා ජේඩීගේ පබ්ලිස් වෙත ප්‍රදානය කොට මීගමුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මීග/මීරි/2/200 යටතේ 1986.07.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුවේ/කෝරළේ 16ඒ හලුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිඳිවල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 53/22/1/3 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ මු. පි. ගම්. 531 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ අංක 62 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.152 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මීරිගන්කන්ද

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | : | ඇල, |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 65. |

ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2021 අගෝස්තු මස 01 වැනි දින.

04-148/5

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එන්. ඒ. ඒ. එස්. නිශ්ශංකආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1984.10.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගම්/ප්‍ර/6277 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නැදුන්ගොල්ල පදිංචි වල්ලගොඩගේ ඇලිස් නෝනා වෙත ප්‍රදානය කොට ගම්පහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 6/448 යටතේ 1987.05.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟබොඩ පත්තුවේ 392 අනුරාගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෙරළුගමපල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 60/21/2,4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. ගම්. 620 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 196 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0901 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : නැදුන්ගොල්ල.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජනපද පාර, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක 197න් කොටසක්, |
| *දකුණට* | : | වෙලේවත්ත, |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 186. |

එන්. ඒ. ඒ. එස්. නිශ්ශංකආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
දොම්පෙ.

2021 ඔක්තෝබර් මස 12 වැනි දින.

04-148/6

**ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍රය අවලංගු කිරීම 104 වගන්තිය සඳහා වූ නිවේදනයයි**

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ 1997 වර්ෂයේ සැප්තැම්බර් මස දහතුන්වන දින මනියර්කුලම හි පදිංචි පොන්නම්පලම් සරවනපෙරුමාල් නමැති අයට වවු/වෙසෙ/ප්‍ර/1546 අංක දරන දීමනා පත්‍රය ප්‍රදානය කොට වවුනියාව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 19/157 යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන සම්පූර්ණ ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති බව වාර්තාවී ඇති බැවිනුත්, හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති බව උතුර පළාත් සභාවට අයත් වෙංගලසෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කුගන් සුලෝජනී මහත්මිය වන මා මෙයින්, දැනුම් දෙමි. එබැවින් එම දීමනා පත්‍රය පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට කටයුතු කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

උපලේඛනය

වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ වෙංගලසෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුරුක්කල්පුදුක්කුලම ග්‍රාම නිලධාරි වසමේ මණියර්කුලම නමැති ගමේ පිහිටා ඇති අක්කර 05 ප්‍රමාණයෙන් වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම. (ගොඩ)

| | | |
|---|---|---|
| *උතුරට* | : | වැව් බැම්ම, |
| *නැගෙනහිරට* | : | සී වල්ලිතම්බිගේ ඉඩම, |
| *දකුණට* | : | ගඟ, |
| *බස්නාහිරට* | : | කාණු. |

සුලෝජනී කේ.,
ප්‍රාදේශීය ලේකම්,
වෙංගලසෙට්ටිකුලම.

2021 මාර්තු මස 31 වැනි දින.

04-62/1

**ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දීමනා පත්‍රය අවලංගු කිරීම 104 වගන්තිය සඳහා වූ නිවේදනයයි**

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ 1997 වර්ෂයේ සැප්තැම්බර් මස දහතුන්වන දින මනියර්කුලම හි පදිංචි පොන්නම්පලම් සරවනපෙරුමාල් නමැති අයට වවු/වෙසෙ/ප්‍ර/1535 අංක දරන දීමනා පත්‍රය ප්‍රදානය කොට වවුනියාව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 16/268 යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන සම්පූර්ණ ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති බව වාර්තාවී ඇති බැවිනුත් හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති බව උතුර පළාත් සභාවට අයත් වෙංගලසෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කුගන් සුලෝජනී මහත්මිය වන මා මෙයින් දැනුම් දෙමි. එබැවින් එම දීමනා පත්‍රය පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට කටයුතු කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.05.06** දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

උපලේඛනය

වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ වෙංගලසෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුරුක්කල්පුදුක්කුලම ග්‍රාම නිලධාරි වසමේ මණියර්කුලම නමැති ගමේ පිහිටා ඇති අක්කර 03 ප්‍රමාණයෙන් වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම. (ගොඩ)

ඉහත සඳහන් පිඹුර අනුව:

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාරට වෙන් කරන ලද ඉඩම, |
| *නැගෙනහිරට* | : | එම, |
| *දකුණට* | : | ආර්. කනපදිපිල්ලයි ඉඩම, |
| *බස්නාහිරට* | : | ආර්. වේලුපිල්ලයි ඉඩම. |

කේ. සුලෝජනී,
ප්‍රාදේශීය ලේකම්,
වෙංගලසෙට්ටිකුලම.

2021 මාර්තු මස 31 වැනි දින.

04-62/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ, දැනට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. පී. සී. එන්. පතිරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1984.08.24 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 09426 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මේරිමවුන්ට්වත්ත, නාරම්මල පදිංචි උස්හෙට්ටිගේ ආරියවතී රුද්‍රිගු වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක F/78/1773/1987 යටතේ 1987.11.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2022.04.29** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ (දැනට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ) දඹදෙණි හත්පත්තුවේ උඩුකහ උතුරු කෝරළේ 291 - පැන්තැනිගොඩ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ (දැනට 1075 දඹගිරිගම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ) ලීනියවත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 7 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ. ග. පි. 77 දරන කට්ටි කැබීමේ පිඹුරේ/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 114 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්. 0.234 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම, මේරිමවුන්ට් වත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 102, |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 115. |

ඩබ්. පී. සී. එන්. පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2021 ඔක්තෝබර් මස 18 වැනි දින.

04-170

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/43046.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :පළාත්/ඉකො/ඉ3/ඇහැ/දී. බ./02/01.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 116, නිතෝගම ග්‍රාම නිලධාරි වසමේ ගල්ලජ්ගම ගමේ බී. එස්. වී. පී. 3829 පිඹුරේ කැබලි අංක 19 හි දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0427 ක ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ඩයලොග් ආසියාටා පීඑල්සී සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 19 හි ඉතිරි කොටස, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 19 හි ඉතිරි කොටස, |
| *දකුණට* | : | කැබලි අංක 19 හි ඉතිරි කොටස, |
| *බටහිරට* | : | මාර්ග රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.08.10 සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු

05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* මෙම ඉඩම ඩයලොග් කුළුණ පවත්වාගෙන යාම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙකුත් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2021.08.10 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ආර්. ඒ. ටී. ශකුන්තලා විජේසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මාර්තු මස 24 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-169

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/45034.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :CPC/LC/LD/4/1/4/468.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවැල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ කෙන්ගල්ල ගමේ මු. පි. මහ 287 පිඹුරේ කැබලි අංක 19න් දක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 18ක් වූ රජයේ ඉඩම් කොටස රජයේ ඉඩම් ආඥා පනත යටතේ සී/ස කුණ්ඩසාලේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මහනුවර මහියංගනය ප්‍රධාන පාර සහ රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | දිගන අත්කම් නිවාස පාර (මු. පි. මහ 3429 හි කැබලි අංක 01), |
| *දකුණට* | : | මු. පි. මහ 287 හි කැබලි අංක 19න් කොටසක් (මුස්ලිම් පල්ලියේ ඉඩමේ වැට), |
| *බටහිරට* | : | මු. පි. මහ 3429 හි කැබලි අංක 1 (මිය ගිය සකූර් මයාගේ ඉඩමේ තාප්පය). |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.02.11 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙකුත් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2022.02.11 දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මාර්තු මස 23 වැනි දින,<br>
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,<br>
''මිහිකත මැදුර'',<br>
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-167

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/36650.<br>
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :<br>
එන්සීපී/පීඑල්සී/එල්05/20/04 .

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 372, තුප්පිටියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තුප්පිටියාව ගමේ අ. හු. පි. 02, පත්‍ර 68 පිඹුරෙහි කැබලි අංක 3161 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8097 ක් පමණ වන රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා බණ්ඩාරනායක මුදියන්සේලාගේ ගාමිණී සෙනරත් බණ්ඩාර මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 3163, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 3163, |
| *දකුණට* | : | කැබලි අංක 3163, |
| *බටහිරට* | : | කැබලි අංක 3163. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය .-* අවුරුදු තිහයි (30) (2022.01.21 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.-* 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙකුත් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2022.01.21 දින සිට වසර 05ක් ගත වන තුරු පවුල තුල පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මාර්තු මස 21 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-168

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/60692.
මධ්‍යම/පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : CPC/LC/LD/4/1/1/270.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔගස්ටාවත්ත ග්‍රාම නිලධාරී වසමේ ඔගස්ටාවත්ත ගමේ මප්‍රාලේ/2009/06/38 දරන අනුරේඛනයේ කැබලි අංක B දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 27.67ක් වූ රජයේ ඉඩම් කොටස රජයේ ඉඩම් ආඥා පනත යටතේ ආගමික කටයුතු සඳහා ඔගස්ටාවත්ත ශ්‍රී මුත්තුමාරි අම්මන් කෝවිලේ භාරකාර මණ්ඩලය විසින් ආගමික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක ඒ සහ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | මාර්ගය සහ මහ 1453 මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ලේ කොටසක්, |
| *දකුණට* | : | මහ 1453 මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ලේ කොටසක් සහ මාර්ගය , |
| *බටහිරට* | : | කැබලි අංක ඒ. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.01.21 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා අනුමත කළ වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*වාර මුදල.* -

*(ආ)* මෙම ඉඩම ආගමික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් හා ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙකුත් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2022.01.21 දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟබදු සඳහා 10% ක දඩ පොලියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මාර්තු මස 23 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-166

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/35191.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LES/BAT/MN/404.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 178 ඒ සින්න උප්පෝඩයි ග්‍රාම නිලධාරි වසමේ සින්න උප්පෝඩයි ගමේ MADA/MPN/2010/129 දළ අනුරේඛනයේ කැබලි අංක 01 දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1307 කට අදළව රජයේ ඉඩම් ආඥා පනත යටතේ සමිති කටයුතු සඳහා ෂෝටෝකන් කරාටේ සංවිධානය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පටුමග, |
| *නැගෙනහිරට* | : | පාර, |
| *දකුණට* | : | විවෘත විශ්ව විද්‍යාල ඉඩම , |
| *බටහිරට* | : | නව කල්මුනේ පාර. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.07.08 සිට ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුගේ තක්සේරුව මත, 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* පළාතේ ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙකුත් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2021.07.08 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

අවංකා මුදලිගේ වීරසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මාර්තු මස 23 වැනි දින,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.